www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව පාර්ලිමේන්තුව තුලින් යුද අයවැය තල්ලු කර ගනී

## Sri Lankan government rams war budget through parliament

**කේ, රත්නායක විසිනි**
**2007 නොවැම්බර් 23**

ශ්‍රී ලංකා ආන්ඩුව තම යුද අයවැය ඡන්ද 118ට 102ක් ලෙස යන්තම් ඡන්ද 16ක බහුතරයකින් සඳුදා පාර්ලිමේන්තු තුලින් තල්ලු කර ගත්තේ ය. විරුද්ධ පක්ෂ රූපිකව අයවැයට විරුද්ධව ඡන්දය පාවිච්චි කල ද දක්ෂිනාංශක එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) යන පක්ෂ දෙක ම ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ)ට එරෙහි තීව්‍ර කෙරෙන යුද්ධයට තමන්ගේ සහයෝගය පැහැදිලි කලහ.

මුදල් සහ ආරක්ෂක යන අමාත්‍ය ධූර දෙක ද දරන ජනාධිපති මහින්ද රාජපක්ෂ, ආරක්ෂක වියදම වාර්තාගත රුපියල් බිලියන 166ක් (එක්සත් ජනපද ඩොලර් බිලියන 1.5ක්) දක්වා තවත් සියයට 20කින් ඉහල දැමූ අයවැයක් නොවැම්බර් 7දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කලේ ය. ප්‍රථමයෙන් නැගෙනහිර සහ දැන් උතුරේ එල්ටීටීඊ පාලන ප්‍රදේශ අල්ලා ගැනීම සඳහා 2002 දී අත්සන් තැබූ සටන් විරාමය විනාශ කරමින් 2005 නොවැම්බරයේ දී බලයට පත් තැන් පටන් මිලිටරි ප්‍රහාර දියත් කිරීම සම්බන්ධව රාජපක්ෂ වගකීම දරයි.

අයවැය මගින් මිල ගනන් තව දුර ඉහල දමනු ඇත්තා වූ යෝධ වක්‍ර බදු පැටවීම හරහා යුද්ධයේ සමස්ත මූල්‍ය බර වැඩ කරන ජනතාවන්ගේ උර මතට පැටවෙයි. මිලිටරියට අවශ්‍ය මුදල් සොයාගැනීම සඳහා සහනාධාර හා සේවා කප්පාදු කිරීමට ආන්ඩුව ක්‍රියා කොට ඇත. ඉතිරි අයවැය පරතරයන් පියවීමට එය සරලව මුදල් අච්චුගැසීමට යොමුව ඇත්තේ උද්ධමන ගින්නට තවදුර තෙල් දමමිනි.

උමතු සහගත ලෙස යුද්ධයට සහයෝගය දී ඇති ජවිපෙහි සහාය රැකගැනීමට ආන්ඩුව මංමුලා සහගත උත්සාහයක යෙදේ. පාලක සභාගයේ කොටස්කාරයෙකු නො වන අතර ම තම හිස් ජනතාවාදී සහ සමහර අවස්ථාවල දී සමාජවාදී පුච්චානම් දොඩවන කම්කරු පන්තියේ ද විශේෂයෙන් ම සිංහල ගැමි දිලින්දන්ගේ ද ආරක්ෂකයෙකු ලෙස කරන රඟපෑම වඩ වඩා හෙලිදරව් කරමින් ජවිපෙ පාර්ලිමේනතුවේ දී ආන්ඩුවට සහයෝගය පුදා ඇත.

ජවිපෙ ආන්ඩුව සමග අයවැයට පක්ෂව ඡන්දය දෙනු හෝ ඡන්දයෙන් වැලකී සිටිනු ඇතැයි යන සමපේක්ෂන බහුල විය. එම පියවර දෙකෙන් කවර එක අනුගමනය කල ද ජවිපෙ දැකගනු ලැබෙනු ඇත්තේ ආන්ඩුව සහ එය මහජනතාවන්ගේ ජීවන කොන්දේසි මත එල්ල කරන නිර්දය ප්‍රහාර සමග එකපෙලට සිටින්නකු ලෙස ය. පැහැදිලිව ම අභ්‍යන්තරිකව ඉරිතැලී තිබෙන ජවිපෙ, එජාපය සහ එල්ටීටීඊ හිතවාදී ද්‍රවිඩ ජාතික සංධානය (ද්‍රජාස) අයවැයට එරෙහිව ඡන්දය ප්‍රකාශ කිරීමට පෙර අවසන් මොහොත දක්වා වැනෙමින් සිටියේ ය. අයවැයට අවසන් අනුමැතිය ලබාදෙන ඡන්ද විමසීම දෙසැම්බර් 14 දා පැවැත්වීමට නියමිත ය.

නොවැම්බර් 19 දා ඡන්ද විමසීම දක්වා පක්ෂ හා කන්ඩායම් 13කින් යුත් තම අඩමාන සභාගය එක්ව ක්‍රියා නො කරනු ඇතැයි යන කාන්සාවෙන් රාජපක්ෂ පසුවිය. කැබිනට් අමාත්‍ය රවුෆ් හකීම් අඟහරුවාදා පාර්ලිමේනතුවේ දී අනතුරු ඇඟවූ පරිදි තිරයෙන් පිටුපස කෙරෙන මන්ත්‍රීවරුන් මිලට ගැනීම කොතරම් පැහැදිලිදැයි කිවහොත්: "මිල ගනන් සඳහන් කොට තිබෙන මුදලට ගතහැකි භාන්ඩ ලෙස ජනයා මන්ත්‍රීවරුන්ව දැක ගනී," යයි ඔහු ප්‍රකාශ කලේ ය. ආන්ඩුව පැත්තේ තබා ගැනීමට ගෙවන කුලියක් වසයෙන් පාලක සභාගයේ සෑම මන්ත්‍රී කෙනෙකුට ම කුමන හෝ ඇමති තනතුරක් දෙනු ලැබ ඇත.

ජනාධිපති රාජපක්ෂගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන විජේදාස රාජපක්ෂ නොවැම්බර් 14 දා විපක්ෂයට එක්විය. ඔහු, රාජ්‍ය ආයතනවල දූෂන පිලිබඳ විමර්ශනය කිරීමේ වගකීම දරන රාජ්‍ය ව්‍යවසාය කොමිසමේ (කෝප්) සභාපතිවරයා විය. වර්තමාන කැබිනට් මන්ඩලය 30කට අඩුකරන ලෙස හා දූෂන පිලිබඳව කෝප් කොමිසමේ චෝදනාවලට ලක් ව සිටින ඇමතිවරුන් දෙදෙනෙකු නෙරපා හරින ලෙස ඔහු ඉල්ලා සිටියේ ය.

එජාප පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රත්නතිලක, රාජපක්ෂටත් ඔහු ගෙනයන යුද්ධයටත් සියලු දෙනාගේ සහාය ලැබිය යුතු යයි ප්‍රකාශ කරමින් ආන්ඩුවට එක්

විය. අයවැය ඡන්ද විමසීමෙන් දෙදිනකට පසුව රාජපක්ෂ ආනුඩ්වේ 109 වන අමාත්‍යවරයා ලෙස රත්නතිලක දිවුරුම් දුන්නේ ය.

අයවැය සාධාරනීකරනය කිරීමටත් ආන්ඩුවෙන් ම මතුවන ඒවා ද ඇතුලුව එයට එරෙහි ඕනෑම විරුද්ධත්වයක් ත්‍රස්ත කිරීමටත් රාජපක්ෂ දේශානුරාගී උත්සන්නිය අවුලුවාලීමේ හිස්ටීරියා උද්ඝෝෂනයක් දියත් කොට ඇත. එක්සත් ජනපද ජනාධිපති බුෂගේ "ත්‍රස්ත විරෝධී යුද්ධයේ" ආදර්ශය අනුව යමින් රාජපක්ෂ හා ඔහුගේ ඇමතිවරු ඕනෑම විරුද්ධත්වයක් "කොටි ත්‍රස්තවාදයට" දෙන සහයෝගයක් වසයෙන් පුරුද්දක් ලෙස හංවඩු ගසති.

"අපි මෙම අයවැය ඉදිරිපත් කලේ රට සංවර්ධනය කරන අතර ම ත්‍රස්තවාදය විනාශ කිරීමටයි... කොටින්ට මෙන් ම අන් අයට ද මෙම අයවැය පරාජය කිරීමට උවමනා වී තබේ," යයි ජනාධිපතිවරයා පසුගිය සිකුරාදා රැකියා විරහිත උපාධිධාරීන් අමතමින් පැවසීය. පසුගිය සතියේදී විජේදාස රාජපක්ෂ විපක්ෂයට එක් වූ විට ආන්ඩුව ඔහුට "කොටියා" යනුවෙන් මොරගසමින් අමනාපය පල කලේ ය.

ආන්ඩුවත් එහි සහායකයනුත් වඩා ඍජු තර්ජන එල්ල කිරීමට පසුබට නො වෙති. එජාපයේ මුල්පෙලේ පාර්ලිමේන්තු මන්ත්‍රීන් තිදෙනෙකු දූෂන චෝදනා පිලිබඳව ප්‍රශ්න කිරීමට පොලිස් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව (සීඅයිඩී) විසින් බලයෙන් ගෙනයනු ලැබිනි. ආන්ඩුවට හිතවත් තමිලීලා විඩුතලයි මක්කල් පුලිහල් නම් පැරාමිලිටරි කන්ඩායමක් තම පාර්ලිමේන්තු සභිකයින් තිදෙනෙකුට අනතුරු අඟවා ඇති බව දජාස සඳුදා පැමිනිලි කලේ ය. දජාස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන ටී. කනගසබේ, ඔහුගේ ඥාතියකු පැහැරගෙන යාම හේතුවෙන් අයවැය ඡන්ද විමසීමට සහභාගි නොවූ අතර අයවැය ඡන්දයෙන් පසුව එම ඥාතියා "සොයාගනු" ලැබිනි.

මාධ්‍ය කොටස් ද වර්ගවාදී උද්ඝෝෂනය සමග අත්වැල් බැඳගත්හ. දක්ෂිනාංශක අයිලන්ඩ් පුවත්පත තම නොවැම්බර් 19 දින කතුවැකිය නම්කලේ "ප්‍රභාකරන්ට එරෙහිව මහින්ද" යනුවෙනි. මෙම අයවැය සතුව "යුද අයවැයක් සතු සියලු ලක්ෂන" තිබෙන බව අයිලන්ඩ් පිලගත්තේ ය. අයවැයට විරුද්ධ වන්නන්ට යුද්ධයට එරෙහි බලවේග සමග "ආන්ඩුව පෙරලීමේ නාමයෙන් පමනක් ම" අත්වැල් බැඳගැනීම පිලිබඳව එය චෝදනා කලේ ය.

## විරුද්ධ පක්ෂ

ආන්ඩුවේ ප්‍රතිගාමී යුද්ධයට සහයෝගය දෙන අතර ම අයවැය විරුද්ධ වීම හරහා වැඩකරන ජනතාවගේ ආරක්ෂකයන් ලෙස පෙනී සිටීමට උත්සාහ දරන එජාපයේ සහ ජවිපෙහි වංචාකාරී ආස්ථානය පිලිබඳව අයිලන්ඩ් කතුවැකිය ඇඟිල්ල දිගු කලේ ය.

ආන්ඩුවට දූෂන චෝදනා එල්ල කල එජාප කථිකයෝ එය විශාල වසයෙන් නය මත රඳා සිටීම සහ උද්ධමන ගින්නට තෙල් දැමීමට හේතුවනු ඇති නව බදු පැටවීම යන අයවැයේ ආර්ථික පාර්ශ්වයන් දැඩි ලෙස විවේචනය කල හ. එහෙත් අති විශාල මිලිටරි වියදම් හෝ යුද්ධය පිලිබඳ කිසිදු විවේචනයකින් වැලකීමට ඔවුහු අනලස් ව වග බලා ගත් හ.

1983 දී ප්‍රථම වරට සිවිල් යුද්ධය ඇරඹීම පිලිබඳ වගකීම දරන එජාපය නිශ්චිතව ම යුද්ධයේ විරුද්ධවාදියෙකු නො වේ. එහෙත් යුද්ධය ආර්ථිකය මත ඇති කරන බලපෑම පිලිබඳව පාලක කවයන් තුල පැවති කාංසාවන් පිලිබිඹු කරමින් 2002 දී සටන් විරාම ගිවිසුමක් අත්සන් කල එය එල්ටීටීඊය සමග සාම සාකච්ඡා ඇරඹීය. 2005 ජනාධිපතිවරනයෙන් පරාජයට පත්වීමෙන් ඉක්බිති ව එජාපය රාජපක්ෂගේ යලි ඇරඹුනු යුද්ධයේ මාවතට වඩ වඩා අවතීර්න වී තිබේ. ඒ අතර ම එය පිලිබිඹු කරන්නේ ආන්ඩුව යෝධ ආර්ථික හා සමාජ අර්බුදයක් ජනනය කරමින් සිටින්නේ ය යන්න පිලිබඳ සංගත ප්‍රභුව තුල පවතින නිරන්තර උත්සුකයන් මිස යන්තමින් හෝ යුද්ධයට එරෙහිව වැඩෙන මහජන විරෝධය නො වේ.

ජවිපෙහි තුලනාත්මක ක්‍රියාව වඩ වඩා පීඩාවට පත්විය. ආරක්ෂක වියදම නාටකාකාර ලෙස ඉහල දමා වැඩකරන ජනතාවන් මත විශාල බර පැටවූ රාජපක්ෂගේ අවසන් අයවැය දෙකට එය පක්ෂව ඡන්දය පාවිච්චි කලේ ය. මෙවර විශාල වසයෙන් වැනි වැනී සිට රාජ්‍ය අංශයේ වැටුප් වැඩි නො කිරීම හා වැටුප් වැඩි කිරීමට පුද්ගලික අංශ පෙලඹවීමට ආන්ඩුව අසමත් වීම විවේචනය කරමින් එය අයවැයට විරුද්ධ විය. ජවිපෙ මන්ත්‍රීවරු ඉහල යන මිල ගනන්, රාජ්‍ය දූෂනය සහ විශාල ඇමති මන්ඩල වියදම් හෙලා දුට හ.

රාජපක්ෂ සහ ඔහුගේ ආන්ඩුව සමග පවත්වාගෙන යන සමීප සබඳතාව මගින් කම්කරු ජනයාගේ දෑස් ඉදිරියේ තමන් අපකීර්තියට පත්වෙතැ යි ජවිපෙ මාරාන්තික බියකින් පසුවෙයි. 2004 දී එය තම පාර්ලිමේන්තු අසුන් ගනන සැලකිය යුතු ලෙස වැඩිකර ගැනීමට ශ්‍රීලනිපය සහ එජාපය කෙරෙහි පුලුල්ව පැතිර පැවති අතෘප්තිය මත රඳා සිටියේ ය. එහෙත් මෑතක දී ආන්ඩුව විසින් මධ්‍යවාර මැතිවරනයක් කැඳවුම් කිරීමට එය සපුරා ම විරුද්ධ වූයේ නව මැතිවරනයකින් තමන්ට ආසන අහිමි වෙතැයි හොඳින් ම දන්නා හෙයිනි.

පාර්ලිමේන්තුව තුල ජීවන තත්වයන්ගේ ආරක්ෂකයන් ලෙස පෙනී සිටින අතර ජවිපෙ තමන් ආන්ඩුවට ලබාදෙන සහයෝගයේ මිල හැටියට ඉල්ලා

සිටින සියල්ලක් ම යුද්ධය වඩා තීව්‍ර කිරීම එල්ල කරගත් ඒවා ය. අයවැයට පෙර ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ නොන්දේසි හතරක් ඉදිරිපත් කලේ ය. ඒවා නම් 2002 සටන් විරාමය නිල වසයෙන් අහෝසි කිරීම, යුද්ධයට දේශපාලන විසඳුමක් සෙවීමට ස්ථාපිත කෙරුනු සර්ව පාක්ෂික නියෝජිත කමිටුව විසුරුවා හැරීම, එක්සත් ජාතීන්ගේ සංවිධානය ශ්‍රී ලංකාවට කරන සංචාර මත තහනමක් පැනවීම සහ රටේ ස්වෛරීභාවය හා භෞමික අඛන්ඩතාව සුරකින බවට ආන්ඩුවෙන් නිල ප්‍රතිඥාවක් නිකුත් කිරීම යි.

අමරසිංහ විසින් ඉලක්ක කරගත් කිසිදු පියවරකට යුද්ධය අවසන් කිරීම සමග කිසිදු සම්බන්ධයන් නැත. රාජපක්ෂ සටන් විරාමයෙන් නිල වසයෙන් ඉවත් නො වී සිටිය ද නැගනහිර බොහෝ එල්ටීටීඊ පාලන ප්‍රදේශ අල්ලා ගැනීමෙන් සහ උතුරේ නව ප්‍රහාර දියත් කිරීමෙන් මිලිටරිය වැලැක්වීමට ද ඔහු ක්‍රියා කොට නැත. ආන්ඩුව සර්ව පාක්ෂික නියෝජිත කමිටුව ස්ථාපිත කලේ එය එල්ටීටීඊය සමග සාකච්ඡා කරන බව බොරුවට ඇඟවීමටත් ප්‍රධාන බලවතුන් තමනගේ පැත්තේ තබා ගැනීමටත් ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය සම්බන්ධයෙන් ගත්කල මිලිටරිය කරන දරුනු මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිලිබඳ එහි සීමිත විවේචන ජවිපෙහි තියුනු විරුද්ධත්වයට බඳුන් ව ඇත.

යුද අයවැයට සහයෝගය දීමට අසමත් වීම පිලිබඳව ආන්ඩුවේ විවේචන කෙරෙහි ජවිපෙ විශේෂයෙන් සංවේදී ය. අඟහරුවාදා පැවති මාධ්‍ය හමුවක දී තම පක්ෂය අයවැයට විරුද්ධ වූයේ එය සාමාන්‍ය ජනතාව මත බදුබර පටවා ඇති නිසාත් නය ඉහල දැමීම නිසාත් බව පැවසූ අමරසිංහ, ජවිපෙ "දේශප්‍රේමී නො වේ" යයි කෙරුනු චෝදනාවන්ගෙන් ලිස්සා ගියේ ය.

සැලකිය යුතු දෙය වනුයේ ශ්‍රී ලංකා ආන්ඩුව එලැඹීමට යත්න දැරිය යුතු මොඩලය ලෙස අමරසිංහ විසින් බ්‍රිතාන්‍ය අගමැති වින්ස්ටන් චර්චිල්ගේ වාර්තාව හුවා දැක්වීමයි. "ඔහු තම පුද්ගලික වාසි කැපකරමින් ආදර්ශවත් ලෙස ක්‍රියාකිරීම නිසා රටේ සියලු පාර්ශ්වයන්ගේ සහයෝගය ඔහුට ලැබුනි" යයි ජවිපෙ නායකයා පැවසීය.

වෙනත් වචනවලින් කියතොත් රාජපක්ෂ කලයුතුව ඇත්තේ මිලිටරි වියදම් කප්පාදු කිරීම නොව මහජන කෝපය සංසිඳවීම සඳහා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ කොන්සර්වේටිව් නායකයා මෙන්

"බෙදා හදාගත් කැපවීමේ" අභිනය රඟ දැක්වීමයි. එවැනි ඉරියව්වක් පෑමට ශ්‍රී ලංකා ජනාධිපතිවරයා කැමති වන්නේනම් දෙසැම්බර් 14දා අයවැයට පක්ෂව ඡන්දය දීමට ජවිපෙ සූදානම් බව අමරසිංහ විස්තර කලේ ය.

තම මූලික අයිතීන් සහ ජීවන කොන්දේසි ආරක්සා කරගැනීමට යුද්ධයට සහ ආන්ඩුවට එරෙහි අරගලයකට වැඩකරන ජනතාවන් තල්ලු කරනු ලැබෙමින් පවතී. එහෙත් අයවැය විවාදයෙන් ප්‍රකාශයට පත්වුනු ආකාරයට ඔවුන්ට කිසිදු පාර්ලිමේන්තු විරුද්ධ පක්ෂයක් කෙරෙහි විශ්වාසය තැබිය නො හැකි ය.

© www.wsws.org